# පුරවැසියා

2023 ඔක්තෝබර්

බිම් මට්ටමේ කතිකාව 1




උද්ඝෝෂණයක නිරත වන ක්ෂුද්‍ර මූල්‍යකරණය නිසා පීඩාවට පත් වූ කාන්තාවන්. (ඡායාරූප www.dailymirror.lk)



අපේ මැදිහත් වීම්වල යහපත් ප්‍රතිඵල තියෙනවා 04

මේවා නියාමනයන් යටතේ නිවැරදි කර ගත යුතු ප්‍රශ්න 06

ක්ෂුද්‍ර මූල්‍යකරණය, දුගී බව සහ දේශපාලනය 08

දුප්පතාගේ බැංකුකරු 09

ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල කාර්යය සාධනය 10


## ක්ෂුද්‍ර මූල්‍යකරණයට රජයේ මැදිහත්වීම

ක්ෂුද්‍ර මූල්‍යකරණය සෙසු බොහෝ දේ සේ දේශපාලන අතකොලුවක් බවට පත්ව ඇත. ශ්‍රී ලංකා රජය ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ ප්‍රධාන තීරකයාය. ක්ෂුද්‍ර මූල්‍ය ආයතන (MPLS) සඳහා අරමුදල් සහ අනෙකුත් සහය ලබාදීමේදී රජය ප්‍රධාන භූමිකාවක් රඟදක්වයි. මෙය බොහෝ ආයතනවල මූල්‍ය දිශානතියට බලපෑම් කරන බවටත් ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල ස්වාධීනත්වය අඩු කරන

02



## ණය ගින්නේ දැවෙන ගෙදර බුදුන්

සිරිලක සිව් දෙසින් සපැමිණි ජනී ජනයා ජනපදය අස්වද්දන අතරේ අලුත් බිමක මුල් අදින්නට දරන ලද්දේ අසීමිත වෙර වෑයමකි. නිජබිම අතහැර සංක්‍රමණය වූ මේ ජනතාව ඒ අතීතයේ අරගල කළේ අහස පොළොව හා වන සතුන්ද

11

## 01 පිටුවෙන් ක්ෂුද්‍ර මූල්‍යකරණයට...

බවටත් ලොකු කනස්සල්ලක් ඇති කර ඇත.

බොහෝ දේශපාලන පක්ෂ සිය දේශපාලන අරමුණු සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ණය හිමියන්ව භාවිත කරයි. පොදුවේ ඡන්දදායකයන්ගේ ප්‍රසාදය ලබාගැනීමේ මාර්ගයක් ලෙස ක්ෂුද්‍ර මූල්‍ය භාවිත කර ඇත. පොලිය අඩු කරන, ගත් ණයවලට සහන කාල ලබාදීම, තම ආධාරකරුවන්ට ක්ෂුද්‍ර ණය ලබාදීම සහ ඇතැම් ප්‍රදේශවල ක්ෂුද්‍ර මූල්‍ය ආයතන ගොඩ නැගීමට පොරොන්දු විය හැකිය.

ක්ෂුද්‍ර මූල්‍ය නියාමනය දේශපාලනීකරණය වීම පිළිබඳ කනස්සල්ලේ ප්‍රතිඵලයක් ලෙස රජය විසින් 2016 ක්ෂුද්‍ර මූල්‍ය පනත සම්මත කිරීමෙන්ම තහවුරුය. කෙසේ වෙතත් පනත පවා ඕනෑවට වඩා සීමා කිරීම සහ මෙම අංශය කෙරෙහි රජයට අවැසි ප්‍රමාණයටත් වඩා පාලනයක් ලබාදීම සම්බන්ධයෙන්ද ප්‍රබල විවේචනයක් පවතී.

- ක්ෂුද්‍ර මූල්‍යවල කාර්යක්ෂමතාව අඩුවීම ණය පැහැර හැරීමේ අවදානම වැඩිවීම.
- දුප්පතුන් සඳහා ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සඳහා ඇති ප්‍රවේශය අඩුවීම.



ක්ෂුද්‍ර මූල්‍යකරණය ගැටළු පිළිබඳව දැනුවත් කිරීම (ඡායාරූප CPA)

- දූෂණය සහ කුලියට ගැනීම් වැඩිවීම.

ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍යකරණය දරිද්‍රතාව අඩු කිරීමේ ධනාත්මක කාර්යභාරයක් අඛණ්ඩව ඉටුකළ හැකි බව සහතික කිරීමට නම් ක්ෂුද්‍ර මූල්‍යකරණය නිර්දේශපාලනික කිරීමේ ක්‍රම අවශ්‍ය බව බොහෝ දෙනාගේ මතයය.

ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ විනිවිදභාවය සහ වගවීම ප්‍රවර්ධනය කිරීම, ක්ෂුද්‍ර මූල්‍ය පනත වඩාත් සමකාලීන සහ අඩු සීමා සහිත බවට පත් කිරීම වැදගත්ය. ■

**- පුරවැසියා**

*බොහෝ දේශපාලන පක්ෂ සිය දේශපාලන අරමුණු සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ණය හිමියන්ව භාවිත කරයි. පොදුවේ ඡන්දදායකයන්ගේ ප්‍රසාදය ලබාගැනීමේ මාර්ගයක් ලෙස ක්ෂුද්‍ර මූල්‍ය භාවිත කර ඇත.*

# කාන්තාවෝ ගොඩයි

බලපත්‍රලාභී රාජ්‍ය හා පෞද්ගලික වාණිජ බැංකු, ප්‍රාදේශීය සංවර්ධන බැංකු, මූල්‍ය හා කල්බදු ආයතනවල ගණුදෙනුකරුවන් අතරින් බහුතරය පිරිමින් වේ. එය ප්‍රතිශතයක් වශයෙන් 61% - 68% වේ. සමෘද්ධි බැංකු සමිති, සකසුරුවම් හා ණය සමුපකාර සමිති, රාජ්‍ය නොවන සංවිධාන ආදියේ ගනුදෙනුකරුවන් බහුතරය කාන්තා පාර්ශවයයි. එය ප්‍රතිශතයක් ලෙස 60% - 67% වේ. කාන්තාවන් ණය ලබා ගන්නා බහුතර බැංකු ක්ෂුද්‍ර මූල්‍ය ආයතන වේ. මේ නිසාම ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍ය සේවා ලාභීන්ගෙන් වැඩි ප්‍රතිශතයක් කාන්තා සේවාලාභීන්ය.

# ණය දෙන අය

ක්ෂුද්‍ර මූල්‍ය ආයතන ණය සේවා සපයනු ලබන අතර ඊට අමතරව ඉතුරුම්, රක්ෂණ හා ගෙවීම් සේවා ඇතුළත් අනෙකුත් මූල්‍ය සේවාවන් ද සපයයි. එමෙන්ම ඇතැම් උපදේශන සේවාවන්ද සපයයි. ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය විවිධත්වයෙන් යුතු ආයතන ගණනාවකින් සමන්විතය. ඒවානම් ඉතුරුම් සමාගම්, සීට්ටු ක්‍රම, ණය දෙන සමිති, මරණාධාර හා සුභසාධන සමිති ඇතුළු ඉතිරි කිරීම් හා ණය දෙන සමිති සමාගම් යනාදියයි. මෙම ක්ෂුද්‍ර මූල්‍ය අංශ පහත පරිදිය.

- ප්‍රාදේශීය සංවර්ධන බැංකු හා අනෙකුත් විශේෂිත බැංකු
- සමූපකාර ග්‍රාමීය බැංකු හා වෙනත් සමූපකාර
- සකසුරුවම් හා ණය සමුපකාර සමිති (ස.ණ.ස)
- සමෘද්ධි බැංකු සමිති
- රාජ්‍ය නොවන සංවිධානවල මූල්‍ය ආයතන
- වෙනත් මූල්‍ය ආයතන (ක්ෂුද්‍ර මූල්‍ය සේවා සපයන වාණිජ බැංකු ලියාපදිංචි මූල්‍ය සමාගම්)



# ක්ෂුද්‍ර මූල්‍යකරණය යනු

ඡායාරූප freepik.com

ආර්ථික ශක්‍යතාවක් නොමැති දුප්පත් මිනිසුන් මිලියන 500 කට අධික සංඛ්‍යාවක් ලොව පුරා ක්ෂුද්‍ර ව්‍යාපාරයන් හි සහ සුළු වෙළඳාමෙහි යෙදෙන බව (Women's World Banking 1995) මගින් ගණන් බලා ඇත. ඔවුන් අතරින් බොහෝ දෙනෙකුට ප්‍රමාණවත් මූල්‍ය සේවා ලබා ගැනීමේ හැකියාව නැත. මෙලෙස අඩු ආදායම්ලාභී කණ්ඩායම් වල ශුභ සිද්ධිය උදෙසා ආර්ථික සංවර්ධන ප්‍රවේශයක් ලෙස ක්ෂුද්‍ර මූල්‍යකරණය ක්‍රමයෙන් පරිණාමය වී ඇත. ඒ අනුව ක්ෂුද්‍ර මූල්‍යකරණය යනු දිළිඳු බව අවම කිරීම සඳහා භාවිතා කළ හැකි හොඳ සංවර්ධන මෙවලමක් වන බැවින් ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටවල ක්ෂුද්‍ර මූල්‍යකරණය ප්‍රචලිත ය. ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ ද ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රියා කාරීත්වය දළු ලා වැඩුනි. ක්ෂුද්‍ර මූල්‍යකරණය පිළිබඳ නිශ්චිත නිර්වචනයක් විග්‍රහ කිරීම අපහසු වුවද සරලව එය ඉතිරුම් හා ණය සමග බැඳුණු සේවාවක් ලෙස වටහා ගත හැකිය. මේ අනුව අඩු ආදායම්ලාභී හා ස්වයං ආදායම්ලාභී ව්‍යවසායකයින්ට මූල්‍ය සේවාවන් සැපයීම මෙමගින් සිදු වේ.

ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රියාකාරකම් ලෙස කාරක ප්‍රාග්ධනය සඳහා අවශ්‍ය වන කුඩා ණය ලබා දීම, ණයට ගන්නා තැනැත්තන් සහ ආයෝජකයන් පිළිබඳ අවිධිමත් ඇගයීම, කණ්ඩායමේ සාමූහික ඇපය හෝ අනිවාර්ය ඉතුරුම් ආදී ඇප ආවරණ සඳහා ආදේශක දීම, ණය නැවත ගෙවීමට ඇති හැකියාව හා කාර්ය සාධනය හා කාර්ය සාධනය පදනම් කර ගනිමින් නැවත නැවත ණය ලබා ගැනීමේ හා විශාල ණය ඉල්ලුමට ඇති හැකියාව, සුමට ණය මුදා හැරීම හා පසුවිපරම් කිරීම, ආරක්ෂිත ඉතිරි කිරීම් නිෂ්පාදිත ආදිය පෙන්වා දිය හැකිය. ක්ෂුද්‍ර මූල්‍ය ආයතන ලෙස ඉතිරි කිරීම් හා ණය සමිති, ණය දෙන සමිති, රාජ්‍ය බැංකු, වාණිජ බැංකු, බැංකු නොවන මූල්‍ය ආයතන මෙන්ම රාජ්‍ය නොවන සංවිධාන ද හඳුනා ගත හැක. මෙම ආයතනයන් හි ක්‍රියාකාරිත්වය විවිධ අණ පනත් හා රෙගුලාසි මත පදනම්ව විවිධ නියාමනයන් අනුව ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ හඳුනා ගත හැකිය. මීට අමතරව මුදල් පොලියට දෙන අය, රන් බඩු උකස් ගන්නන්, සීට්ටු හා ණය සමිති මෙන්ම ෆිනෑන්ස් ආයතන ආදී අවිධිමත් ක්ෂුද්‍ර මූල්‍ය සේවා සපයන්නන්ද ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රියාකාරිත්වය තුළ හඳුනා ගත හැකිය.

**මුදල් පොලියට දෙන අය, රන් බඩු උකස් ගන්නන්, සීට්ටු හා ණය සමිති මෙන්ම ෆිනෑන්ස් ආයතන ආදී අවිධිමත් ක්ෂුද්‍ර මූල්‍ය සේවා සපයන්නන්ද ඇත.**

මෙලෙස ක්‍රියාත්මක වන ක්ෂුද්‍ර මූල්‍ය ආයතන මගින් ගෘහ ආශ්‍රිත කර්මාන්ත, ස්වයං රැකියා කරන්නන් මෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට අවශ්‍ය මූල්‍ය හා උපදෙස් ලබා දෙමින් ඔවුන්ගේ ආර්ථිකයන් නගා සිටු වීමට කටයුතු කරයි. මෙමගින් ක්ෂුද්‍ර මූල්‍ය සේවා ලාභීන්ගේ සහභාගීත්වය සංවර්ධනය පවත්වා ගනිමින් ඔවුන්ගේ ව්‍යවසායකයත්වය වැඩි දියුණු කිරීම සිදුවන අතරම ඔවුන් තුළ ඉහළ සේවා නියුක්තියක් ඇති කරමින් ග්‍රාමීය දරිද්‍රතාවය අවම කරමින් ග්‍රාමීය සංවර්ධනය කරා ලඟා වීමට ඉඩ ප්‍රස්ථාව ලබා දීම ද ශ්‍රී ලංකා ආර්ථිකයේ ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රියාකාරිත්වය තුළ හඳුනා ගත හැකි ලක්ෂණය. ■

**- පුරවැසියා**

# අපේ මැදිහත් වීම්වල යහපත් ප්‍රතිඵල තියෙනවා



ඡායාරූපය: CPA

**සුරංග රූපසිංහ**
ආර්ථික සහයෝගිතා පදනම
කන්තලේ

අපි දීර්ඝ කාලයක් තිස්සේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එක්ක එකතු වෙලා පොළොන්නරුව හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක වල වැඩසටහන් ක්‍රියාත්මක කර ගෙන යනවා. මේ ප්‍රදේශ වල කාන්තාවන් විශාල ප්‍රමාණයක් ක්ෂුද්‍ර මූල්‍ය ණය උගුලේ හිර වෙලා ඉන්නවා. අපේ මැදිහත් වීමෙන් ඔවුන්ට යම් කිසි සහනයක් ලබා දෙන්න පුළුවන් වෙලා තියෙනවා.

ක්ෂුද්‍ර මූල්‍ය ණය කියන සංකල්පය ඉතාම හොඳ එකක්. ඒත් හොඳ ආයතන වගේම නරක ආයතනත් මේවාට රිංගීම නිසා තත්ත්වය නරක් වුණා. උදාහරණයට කිව්වොත් අපි දන්නවා ' සණස' ගැන. මේකේ ණය වාරික එකතු කරන්න ගෙදරට ආපුවහම ඒ එන මුදලත් ප්‍රවාහන විදියට ණයට එකතු කරනවා. එක පාරක් ආවත් තුන් හතර පාරක් ආපු විදිහට ප්‍රවාහන ගාස්තු අය කරනවා. ඒ වගේම ඇතැම් ආයතන ණයට ඇප විදිහට ඔප්පු රදවගෙන තියෙනවා. ක්ෂුද්‍ර මූල්‍ය පනත අනුව එහෙම ඔප්පු ඇපයට තියා ගන්න බෑ.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයත් අපිත් මේ ප්‍රදේශ වලට එනකොට අපිට අහන්න ලැබුනේ සියදිවි නසා ගැනීම් සහ දැවැන්ත අර්බුද.

අපි මේ ප්‍රයත්නයේදී බැලුවේ අපිට දෙන්න පුළුවන් සහය මොනවද කියන එක. ඒ අතර ප්‍රධානම එකක් තමයි නීති ආධාර සැපයීම. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සහය ඊට උපරිම ලැබුණා. අනෙක් කරුණ ආර්ථික සාක්ෂර තාවය ලබා දීම. ඒකත් අපි සාර්ථකව තවමත් කරමින් ඉන්නවා.

*මේකේ ණය වාරික එකතු කරන්න ගෙදරට ආපුවහම ඒ එන මුදලත් ප්‍රවාහන විදියට ණයට එකතු කරනවා. එක පාරක් ආවත් තුන් හතර පාරක් ආපු විදිහට ප්‍රවාහන ගාස්තු අය කරනවා. ඒ වගේම ඇතැම් ආයතන ණයට ඇප විදිහට ඔප්පු රදවගෙන තියෙනවා. ක්ෂුද්‍ර මූල්‍ය පනත අනුව එහෙම ඔප්පු ඇපයට තියා ගන්න බෑ.*

මේ ප්‍රදේශ වල පොදු දේ තමයි කවුරුහරි ණයක් දෙනවා නම් පොලිය කීයක් වුනත් ගන්නවා. මේ සාක්ෂරතාවයක් නොමැති කම. දැන් මිනිස්සු දන්නවා ගන්න ඕන තැන් අඩු පොලී වගේ දේවල්.

අපි මෙතනදි කළේ මේ ගැටලු හඳුනාගෙන මානව හිමිකම් කොමිෂන් සභාව, තොරතුරු කොමිසම වැනි ආයතනවල පිහිට පතමින් එම ගැටළු වලට විසඳුමක් සෙවීමයි. ඒ වගේම මහ බැංකුව සමග කටයුතු කිරීමත් අපි කළා. මහ බැංකුවට වුණත් තියෙන ප්‍රධාන ගැටලුවක් තමයි සම්පත් දායකත්වය නැති කම. ඒ සහය අපි දුන්නා. අපි ණය බරින් මිරිකෙන අවංක ප්‍රශ්න තියෙන පිරිස් හඳුනා ගෙන ඒ අයව මහ බැංකු නියෝජිතයන්ට මුණ ගස්සලා බොල් ණය විදිහට ඇතැම් ණය කපා හරින්නත්, ණය සහන ලබා දීමටත් කටයුතු කළා. ඉඩම් වල ඔප්පු තියාගෙන ණය දුන්න ආයතනවල විස්තර හොයලා මහ බැංකුව ලවා ඒවා නිදහස් කරගන්නත් අපි කටයුතු කරලා තියෙනවා.

ගම්වල ණය ගත්ත පිරිස් ඒකරාශී කරලා ඒ අයට ආර්ථික සාක්ෂරතාවය ලබා දීම අපි අඛණ්ඩව කරනවා. මහ බැංකුවට පවා ඒ පිරිස් කාණ්ඩයන් එකතු කරලා යොමු කිරීම අපි කරනවා. අද ඒ දේවල් වල යහපත් ප්‍රතිඵල තියෙනවා. හොඳ දැක්මක් කැපවීමක් ඇතිව වැඩ කරනවනම් මේ ප්‍රශ්නය මීට වඩා සාර්ථකව විසඳගන්න පුළුවන්. ඒක විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයත් එක්ක එකතු වෙලා අපි කරන මේ වැඩවලින් තහවුරු වෙලා තියෙනවා. ■



ක්ෂුද්‍ර මූල්‍යකරණය ගැටළු පිළිබඳව කන්තලේ ප්‍රදේශයේ සාකච්ඡාවක් (ඡායාරූප CPA)



ක්ෂුද්‍ර මූල්‍යකරණය ගැටළු නිරාකරණය ගැන පැවැති වැඩමුළුවක් (ඡායාරූප CPA)

# ක්ෂුද්‍ර මූල්‍ය ධන සහ ඍණ

ක්ෂුද්‍ර මූල්‍යකරණය ශ්‍රී ලංකාවේ මිනිසුන්ට ධනාත්මක සහ ඍනාත්මක එසේ නැතිනම් යහපත් සහ අයහපත් යන දෙඅංශයෙන්ම සැලකිය යුතු බලපෑමක් ඇති කර ඇත.

## ධනාත්මක බලපෑම්

ක්ෂුද්‍ර මූල්‍යකරණය දරිද්‍රතාව අවම කිරීමට උපකාරී වී ඇත. අධ්‍යයනවලින් පෙන්නුම් කර ඇත්තේ ක්ෂුද්‍ර මූල්‍ය ණය ගැනුම්කරුවන් ණය නොගන්නා අයට වඩා දරිද්‍රතාවයෙන් මිදීමට ඇති ඉඩකඩ වැඩි බවයි. ක්ෂුද්‍ර මූල්‍යකරණය ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට උපකාරී වී ඇත. ක්ෂුද්‍ර මූල්‍ය ණය ගැනුම්කරුවන් තම ව්‍යාපාර ආරම්භ කිරීමට හෝ පුළුල් කිරීමට වැඩි ඉඩක් ඇති අතර ඒ මගින් රැකියා උත්පාදනය වන අතර ආර්ථික වර්ධනයට දායක වේ. ක්ෂුද්‍ර මූල්‍යකරණය කාන්තාවන් සවිබල ගන්වා ඇත. ක්ෂුද්‍ර මූල්‍ය ණය ගැනුම්කරුවන්ගෙන් බහුතරය කාන්තාවන් වන අතර, ක්ෂුද්‍ර මූල්‍යකරණය ඔවුන්ගේ ආදායම්, වත්කම් සහ තීරණ ගැනීමේ බලය වැඩිකර ගැනීමට ඔවුන්ට උපකාරී වී ඇත.

## ඍනාත්මක බලපෑම්

ඇතැම් ක්ෂුද්‍ර මූල්‍ය ණය ගන්නන් ණය උගුල්වලට හසුවී ඇත. ස්වාභාවික විපත් හෝ අසනීපයක් වැනි අනපේක්ෂිත තත්ත්වයන් හේතුවෙන් ණය ගැනුම්කරුවන්ට තම ණය ආපසු ගෙවීමට නොහැකි වූ විට මෙය ඉබේටම සිදුවිය හැකිය. සමහර ක්ෂුද්‍ර මූල්‍ය ආයතන කොල්ලකාරී ණයදීමේ ක්‍රියාවන් සම්බන්ධයෙන් චෝදනා ලබා ඇත. මෙයින් අදහස් වන්නේ ඔවුන් ඉහළ පොලී අනුපාත සහ ගාස්තු අය කරන අතර ණය ගැනුම්කරුවන්ට ඔවුන්ගේ ණය ආපසු ගෙවීම මේ නිසා අපහසු වනු ඇත. ක්ෂුද්‍ර මූල්‍ය සෑමවිටම දුප්පත්කමේ පතුළේම සිටින ජනතාව වෙත ළඟාවී නැත. සමහර ආයතන මධ්‍යම ආදායම්ලාභීන් ඉලක්ක කරගනිමින් ණය ක්‍රියාත්මක කරයි.

සමස්තයක් වශයෙන් ගත් කල ශ්‍රී ලංකාව තුළ ක්ෂුද්‍ර මූල්‍යකරණයේ බලපෑම යහපත්ය. කෙසේ වෙතත් ඉහළ පොලී අනුපාත සහ කොල්ලකාරී ණයදීමේ පිළිවෙත් වැනි ආමන්ත්‍රණය කළ යුතු අභියෝගද ඇත. ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍යකරණයෙන් යහපත් ප්‍රතිඵලද පුද්ගලයන්ගේ විශේෂිත උදාහරණ බලමු.

ශ්‍රී ලංකාවේ උතුරු ග්‍රාමීය ප්‍රදේශයේ කාන්තාවක් කුඩා එළවළු අලෙවි ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ක්ෂුද්‍ර මූල්‍ය ණයක් ලබා ගත්තාය. එම ණය මුදලින් ඇයගේ ආදායම වැඩිකර ගැනීමටත්, පවුලට අවශ්‍ය පහසුකම් සැලසීමටත් හැකිවිය.

ශ්‍රී ලංකාවේ දකුණේ කාන්තාවන් පිරිසක් මහන සමූපාකාරයක් ආරම්භ කිරීමට ක්ෂුද්‍ර මූල්‍ය ණයක් ලබාගත්හ. මෙම ණය මුදල ඔවුන්ට රැකියා උත්පාදනයට සහ ආදායම් උත්පාදනයට ඉවහල් විය.

ක්ෂුද්‍ර මූල්‍ය යනු මැජික් යෂ්ටියක් නොවන බව සැලකිල්ලට ගැනීම වැදගත්ය. එය මිනිසුන්ගේ ජීවිත වැඩි දියුණු කිරීමට භාවිත කළ හැකි මෙවලමකි. එහෙත් එහි අවදානම් නැතිවා නොවේ.

ශ්‍රී ලංකාවේ නැගෙනහිර ප්‍රදේශයේ මිනිසෙක් මාළු වගා කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ක්ෂුද්‍ර මූල්‍ය ණයක් ලබා ගත්තේය. එම ණය මුදල ඔහුගේ ආදායම වැඩිකර ගැනීමටත්, ජීවනෝපාය දියුණු කිරීමටත් උපකාර විය. මේ ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍යකරණයෙන් උදව් උපකාර ලැබූ බොහෝ දෙනකුට උදාහරණ කිහිපයකි. ක්ෂුද්‍ර මූල්‍යකරණය රටේ දිළිඳුකම් තුරන් කිරීම සහ රටේ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමෙහිලා සැලකිය යුතු කාර්යභාරයක් ඉටුකර ඇත. කෙසේ වෙතත් ක්ෂුද්‍ර මූල්‍ය යනු මැජික් යෂ්ටියක් නොවන බව සැලකිල්ලට ගැනීම වැදගත්ය. එය මිනිසුන්ගේ ජීවිත වැඩි දියුණු කිරීමට භාවිත කළ හැකි මෙවලමකි. එහෙත් එහි අවදානම් නැතිවා නොවේ. මෙහිදී ක්ෂුද්‍ර මූල්‍ය නියාමනය කර ඇති බවත්, කොල්ලකාරී ණයදීමේ ක්‍රමවලින් ණය ගැනුම්කරුවන් ආරක්ෂා කර ඇති බව සහතික කර ඇතත්, එය ස්ථිරයටම ගත යුතු නැත. ■

**- පුරවැසියා**

- **ක්ෂුද්‍ර මූල්‍යකරණය පිළිබඳ සංගමයේ අදහස කෙබඳුද?**

ක්ෂුද්‍ර මූල්‍ය ණය කිව්වහම අද හුඟක් දෙනෙක් සරලව හිතන කාරණය තමයි ණය දෙනවා ණය ගන්නවා කියන කාරණය. ඒ වගේම ණය දෙන අය භයානක අය ණය ගන්න අය ඉතාම අහිංසක පිරිසක් වගේ චිත්‍රයක් තමයි සමාජගත වෙලා තියෙන්නෙ. ඒක එහෙම නෙමෙයි. අපි සංගමයක් විදිහට මේක තේරුම් ගන්නේ ඉතා පුළුල් විෂයක් විදිහටයි. අපි ණය දෙන්න කලින් ප්‍රජා මූල්‍ය සංවිධාන බිහි කරනවා. ඒක හරහා ගමේ කාන්තාවන් සවි බල ගැන්වීමේ ක්‍රියාවලියක් සිද්ධ වෙනවා. ඊට විශාල වශයෙන් දැනුවත් කිරීම් මාස දෙක තුනක් තිස්සේ සිද්ධ කරනවා. මූල්‍ය සාක්ෂරතාවය ඇති කිරීම එහි ප්‍රධාන අරමුණයි. ණය කළමණාකරණය කිරීම, ණය පිළිබඳ ගෙවීම, ඉතිරි කිරීම මේ හැමදේම අපි දැනුවත් කරනවා. ඒ හරහා එකිනෙකා අතර ලොකු විශ්වාසයක් ගොඩ නගලා තමයි අපි ණය ලබා දෙන්න. එහෙම නැතුව කුඩා ණය කියලා සරල අර්ථයක් අපිට නැහැ.

- **මෙරට ආර්ථිකයට මේ හරහා ප්‍රගතියක් සිදු වෙලා තියෙනවද?**

පැහැදිලිවම ඔව්! විශාල දායකත්වයක් අදටත් වෙනවා. කොවිඩ් වසංගතව වගේම, ආර්ථික කඩා වැටීමත් එක්ක බහුලවම අසරණ බාවයට පත් වුණේ දුප්පත් පිරිස. ඒ අයට කිසිම පිළිසරණක් නැති වුණා. එදිනෙදා රැකියා අහිමි වුණා. ළමයි පාසලට පවා යන්න බැරි තත්ත්වයන් උදා වුණා. මේ අවස්ථාවන්හිදී කාන්තාවන්ට මේ ණය අරගෙන යම් සහනයක් ලබා ගන්න පුළුවන් වුණා. අන් අයට අත නොපා පවතින්න පුළුවන් වුණා. සමහරු නව රැකියා උත්පාදනය කළා. මේ නිසා රටේ ආර්ථිකයට ලොකු ශක්තියක් වුණා. මේක ඉතාම හොඳ ව්‍යාපෘතියක්. මේ හරහා ගම් වලට විශාල ශක්තියක් ඇති වෙනවා. කුටුම්බ ශක්තිමත් කියන්නෙම ඒක රටේ ආර්ථිකයට ඉතාම හොඳ ප්‍රවණතාවක්.

- **ක්ෂුද්‍ර මූල්‍ය ණය සම්බන්ධව ගිවිසුම් සහ ලියකියවිලි ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වා ගෙන යෑම හරහා ප්‍රජාවන්ගේ භාෂා ප්‍රතිපත්තියේ මූලික කරුණු උල්ලංඝනය වන බව මානව හිමිකම් කොමිසමත් පිළිගන්නවා. ඒ පිළිබඳ සංගමයේ අදහස කෙබඳුද?**

අපි සංගමයක් විදිහට ඔය තත්ත්වය ජය ගැනීමට ක්‍රියා කරමින් ඉන්නවා. දමිළ සහ සිංහල භාෂා වලින් අපි වැඩ කරනවා. මේ තත්ත්වය ලංකාව තුළ බහුලව දකින්න පුළුවන්. අද රජයේ පිළිගත් බැංකු පවා ණය ගනු දෙනුවකදී ඉංග්‍රීසි ලේඛන ලබා දෙන්නේ. ඒවායේ කරුණු ණය ගන්න පුද්ගලයා තබා බැංකු සේවකයන් පවා දන්නවාද කියලා සැකයි. මේ තත්ත්වයන් වෙනස් කරමින් ඉදිරියට යන්න සංගමයක් විදිහට අපි උත්සාහ කරනවා.



**උදය බණ්ඩාර**
ගරු සභාපති
ලංකා ක්ෂුද්‍ර මූල්‍ය වෘත්තිකයන්ගේ සංගමය

# මේවා නියාමනයන් යටතේ නිවැරදි කර ගත යුතු ප්‍රශ්න

- **ප්‍රජාවන්ට ක්ෂුද්‍ර මූල්‍ය සේවා සපයන ආයතන වල අධික පොලිය බරපතළ ගැටලුවක් වෙලා. මේ පොලිය සහනදායී තත්ත්වයක පවත්වා ගෙන යන්න බැරිද?**

මූල්‍ය සේවා සපයන ආයතනත් බැංකු වලින් ණය අරගෙන මෙම සේවාවන් පවත්වා ගෙන යන්නෙ. ඒ නිසා මෙම ආයතන පවත්වා ගෙන යෑම, නඩත්තු කිරීය, සේවක පඩි නඩි ගෙවීම කියන සියලු කාරණා සලකා බලන්න වෙනවා. ඒවත් රැක ගනිමින් මේ දේවල් කරන්න වෙලා තියෙන්නෙ. ඒ නිසා අධික පොලිය වැඩි කළ යුතුයි කියලා අපි කියන්නෙ නැහැ. ඒත් පහුගිය කාලයේ පොලිය වැඩි කිරීම මහ බැංකුවත් කළා. කොටින්ම මහ බැංකුව

නිවේදනය කළා පොලිය ස්ථාවර තැනක තබා ගන්න බැහැ කියලා. ඒ මොහොතේ පවා අපි අපේ සාමාජිකයන්ට කිව්වා පොලිය 35% ක් උපරිමය පවත්වා ගෙන යන්න කියලා.

- **ලංකාව තුළ ණය දෙන ආයතන දහ දාහක් පමණ ඇතැයි පැවසෙනවා. ඔබ සංගමයේ සාමාජිකත්වය ලබා ගත් ආයතන කොපමණක් තියෙනවද?**

සාමාජික ආයතන 51ක් තියෙනවා. අපි ඉතාම දිගු ක්‍රියාවලියකින් පස්සේ තමයි අපේ සාමාජිකත්වය දෙන්නේ. දැනට අපේ සංගමයේ ලියාපදිංචි ආයතන වලට කිසි චෝදනාවක් නෑ. අපි නිතරම ඒ ආයතන පිළිබඳව අධීක්ෂණය කරනවා.

- **දැනට මහ බැංකුව පිළිගන්න මහ බැංකුවේ ලියාපදිංචි ආයතන ඇත්තේ හතරක් පමණයි. මහ බැංකුව ඔබ සංගමයේ සෙසු අය පිළිනොගන්නේ ඇයි?**

මහ බැංකුවට මේ විෂය අලුත් දෙයක්. ඒ අයත් තව මේ පිළිබඳව අධ්‍යයනය කරනවා. දැනට මහ බැංකුවේ පිළිගැනීමට ලක් වී ඇත්තේ ඉහල ප්‍රාග්ධනයක් ඇති ආයතන පමණයි. ඒ නිසා එහෙම කොන්දේසි සැපිරිය හැකි ආයතන දැනට ඇත්තේ හතරයි. ඉදිරියේදී මේ තත්ත්වයන් දියුණු වෙලා බොහෝ සමාගම් මහ බැංකුවේ විශ්වාසය දිනා ගනී.

*මේ බොහෝ දේවලු වලට හේතුව ණය ලබා ගත් මෙන්ම ණය ලබා දෙන ආයතන වලත් විනයක් නැති කම. අනෙක මෙරට ජනතාව තුළ මූල්‍ය සාක්ෂරතාවයක් නැති කම. ඉතිරි කිරීමක් නැති කම. මේ හැමදේම හෙමිහිට ගොඩ නැගිය යුතුයි. හැම තිස්සේම වැරැද්ද විතරක් කතා කරලා බෑ.*

- **ක්ෂුද්‍ර මූල්‍ය කටයුතු සම්බන්ධ නියාමන අධීකාරීත්වයක් අවශ්‍ය යැයි විශ්වාස කරනවද?**

ඔව්! අපි වත්මන් ආණ්ඩුවෙන් මෙය ඉක්මනින් ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලීම් කරලා තියෙනවා. දැනට ඇතිවී තියෙන බරපතළ ප්‍රශ්න බොහොමයකට ඇති ස්ථිර සාර විසඳුම තමයි නියාමන අධිකාරියක් ඇති කිරීම. අද හතු පිපෙන්න වාගේ ණය දෙන ආයතන බිහි වෙනවා. මහ බැංකුවට වුණත් මේ වෙනුවෙන් කළ හැකි කාර්ය අවමයි. මෙය ආණ්ඩුවේ මැදිහත් වීමෙන් විසඳා ගත යුතු ප්‍රශ්නයක්. දැනට සංගමයක් විදිහට අපිටත් කළ හැකි කාර්ය අවමයි. ඒත් ක්ෂුද්‍ර මූල්‍යකරණය නිසා ඇති වන ප්‍රශ්න වලදී අපගේ සංගමය දෙස පවා බලන්නේ කිසිඳු ප්‍රමිතියක් නැති ආයතන දිහා බලන කෝණයෙන්මයි. මේ තත්ත්වය වෙනස් කර ගන්න නම් ඉක්මනින්ම මේ අමාත්‍යවරයා හෝ මැදිහත්ව නියාමන අධිකාරියක් පිහිට විය යුතුයි.

- **ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා ගත් බොහෝ පිරිස් ලිංගික බලහත්කාරකම් වලට ලක් වෙලා තියෙනවා, ණය අය කර ගැනීමට එන පුද්ගලයන් අතින්. ඒ වගේම සමහරු සියදිවි නසා ගෙන තියෙනවා. මේ බේදවාචකය ගැන සංගමය දැනුවත්ද?**

අපිත් මේ බොහෝ ප්‍රශ්න ගැන දැනුවත්. මේ බොහෝ දේවලු වලට හේතුව ණය ලබා ගත් මෙන්ම ණය ලබා දෙන ආයතන වලත් විනයක් නැති කම. අනෙක මෙරට ජනතාව තුළ මූල්‍ය සාක්ෂරතාවයක් නැති කම. ඉතිරි කිරීමක් නැති කම. මේ හැමදේම හෙමිහිට ගොඩ නැගිය යුතුයි. හැම තිස්සේම වැරැද්ද විතරක් කතා කරලා බෑ. ඒවාට විකල්පත් සෙවිය යුතුයි. මාධ්‍ය නිතර ණය ලබා ගත් අය කියන කතා වලට ඉඩක් දෙනවා. ණය ලබා දෙන ආයතන වලට කතා කරන්නේ නෑ. ණය ගන්න කොට තියෙන ආශාව ණය ගෙවද්දී නෑ. ඒක මිනිස් ස්වභාවය. එහෙම කියලා ණය දුන්නු මිනිස්සු දඬු කඳට ගහලා හරි යන්නෙ නෑ. මේවා නියාමනයන් යටතේම නිවැරදි කර ගත යුතු ප්‍රශ්න.

- **දැනට ණය ලබාගත් අයගේ දුක් ගැනවිලි, ගැටලු විසඳන යාන්ත්‍රණයක් සංගමයට තියෙනවද?**

අපි සියලු පැමිණිලි බාර ගන්න පුද්ගලයන් පැය විසි හතරම යොදවලා ඉන්නවා. රාජ්‍ය ඇමතිවරයටත් අපි ඒ බව දන්වලා තියෙනවා. ඉදිරියේදී බොහෝ අඩුපාඩු අවම කරගෙන මේ කේෂ්ත්‍රය තුළ ක්‍රියා කරන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා. මොකද ඇප නැති බොහෝ පිරිස වැඩියි. අපි ඒ පිරිසටයි ණය දෙන්නෙ. එතකොට අපිටත් ලොකු අවධානමක් තියෙනවා. මේ දෙපිරිසම ලොකු අවබෝධයකින් වැඩ කිරීම වැදගත්. මේක ඉතාම හොඳ ක්‍රියාවලියක්. එය බංග්ලාදේශය තුළ සාර්ථක වුනා නම් අපිත් සාර්ථක කර ගැනීමට සැමගේ සහයෙන් උත්සාහ කළ යුතුයි.

**- ටිරාන් බංගගමආරච්චි**

# ක්ෂුද්‍ර මූල්‍යකරණය, දුගී බව සහ දේශපාලනය

අද දවසේ දේශපාලනය නොවන කිසිවක් නැතිවා සේ ම ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රයද දේශපාලන අතකොලුවක් බවට පත්වී ඇත. පවතින රජය සැමවිටම ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ ප්‍රධාන තීරකයාය. මේ නිසාම ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සඳහා අරමුදල් සහ අනෙකුත් සහන ලබාදීමේදී රජය හැමවිටම ක්ෂුද්‍ර මූල්‍ය ණයහිමියාව තම දේශපාලන අධිකාරිය යටතට නම්මා ගැනීමට උත්සාහ කරයි. ක්ෂුද්‍ර මූල්‍ය ආයතනත් රජය යටතේ ක්‍රියාත්මක කිරීම තුළ ඒවායේ මූල්‍ය දිශානතියට බලපෑම් කරන බවත් ලැබෙන චෝදනා අතර වේ. මේ හේතුවෙන් ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල ස්වාධීනත්වය අඩු කර ඇතැයිද එම ආයතන නගන මැසිවිල්ලකි.

සෙසු දේශපාලන පක්ෂද ක්ෂුද්‍ර මූල්‍ය ණය හිමියාව තම දේශපාලන ප්‍රවාහයට ඇද ගැනීමට බොරු පොරොන්දු සපයනු පෙනේ. මෙය ඡන්දදායකයාගේ ප්‍රසාදය ලබාගැනීමේ මාර්ගයක් වී ඇත. පොලිය අඩු කිරීම, ගත් ණය කපා හරින බව කීම, ණය කාලසීමාව දික් කිරීම ණය ලබාදීම සහ ඇතැම් ප්‍රදේශවල ක්ෂුද්‍ර මූල්‍ය ආයතන පිහිටුවීමට පොරොන්දු වීම වැනි කාරණා ඡන්ද කාලයට දේශපාලන වේදිකා බදු ගත් කරුණු බවට පත්වී ඇත.

ක්ෂුද්‍ර මූල්‍ය නියාමනය දේශපාලනීකරණය වීම නිසාම එයට යම් අස්වැසිල්ලක් ලබාදීමට රජය විසින් 2016දී ක්ෂුද්‍ර මූල්‍ය පනත සම්මත කිරීම හඳුන්වා දිය හැකිය. එම පනත තුළ ඕනෑවටත්

ලංකාව තුළ දුගී බව නැති කිරීමට නොහැකි එක සාධකයක් ලෙස මේ සියලු අංශ තුළට දේශපාලනය රිංගීම හැඳින ගත හැකිය. ක්ෂුද්‍ර මූල්‍යකරණය හරහා මෙරට තුළ දරිද්‍රතාව ධනාත්මක කාර්යභාරයක් අඛණ්ඩව ඉටු කළ හැකි බව සහතික කිරීමට නම් ක්ෂුද්‍ර මූල්‍යකරණය නිර්දේශපාලනික කිරීමේ ක්‍රම අවශ්‍යය.

වඩා සීමා කිරීම් හරහා මෙම අංශය කෙරෙහි රජයට අවැසි ප්‍රමාණයටත් වඩා පාලනයක් ලබාගැනීම තුළ නැවත දේශපාලන අත පෙවීම සිදුව ඇත. එය රජයේ ඡන්ද ව්‍යාපාරය බවට පෙරළාගෙන ඇත. සමෘද්ධි, ජනසවිය වැනි රජයේ සියලු ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රම අවසානයේ ඡන්ද ගොඩ නගන මැෂින් බවට පත්වී ඇත.

ලංකාව තුළ දුගී බව නැති කිරීමට නොහැකි එක සාධකයක් ලෙස මේ සියලු අංශ තුළට දේශපාලනය රිංගීම හැඳින ගත හැකිය. ක්ෂුද්‍ර මූල්‍යකරණය හරහා මෙරට තුළ දරිද්‍රතාව ධනාත්මක කාර්යභාරයක් අඛණ්ඩව ඉටු කළ හැකි බව සහතික කිරීමට නම් ක්ෂුද්‍ර මූල්‍යකරණය නිර්දේශපාලනික කිරීමේ ක්‍රම අවශ්‍යය. එහෙත් එය සිදුකිරීම අපහසු කාර්යයක් වී ඇත.

කාලෙන් කාලයට දේශපාලන පොරොන්දුවක් වෙනුවට ස්ථාවර ප්‍රගතියක් කරා යන දැක්මක් මේ අංශය තුළ ඇති කිරීම සියලු දේශපාලන පක්ෂ ඒකරාශී විය යුතුය.

ක්ෂුද්‍ර මූල්‍ය අංශයට රජය කරන මැදිහත්වීම අඩු කළ යුතුව ඇත. එහි ස්වාධීනත්වය ශක්තිමත් කළ යුතුය. ක්ෂුද්‍ර මූල්‍ය පනත වඩාත් සමතුලිත සහ අඩු සීමාසහිත බවට පත් කිරීම සඳහා ප්‍රතිසංස්කරණයන් අවශ්‍යය. මේ සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ආයතන මෙන්ම සිවිල් සමාජ සංවිධාන සහ පරිත්‍යාගශීලීන් ඇතුළු සියලු පාර්ශ්වකරුවන්ගේ කැපවීම සාමූහික උත්සාහයක් අවශ්‍යය. එයද දේශපාලන ගොදුරක් නොවීමට පරිස්සම් විය යුතුය. ■



ක්ෂුද්‍ර මූල්‍යකරණය ගැටළු නිරාකරණය ගැන CPA මගින් පැවැති වැඩමුළුවක් (ඡායාරූප CPA)



ඡායාරූප www.ft.lk

# මහ බැංකුව වග කියන්න ඕන

**විජයදාස රාජපක්ෂ**
අධිකරණ ඇමති

**පිළිතුර තමයි අපිට මේ විෂය පථය අයිති නැහැ කියන එක. මේක බරපතළ කාරණයක් නේද?**

එතන දෙපැත්තටම තර්ක කරන්න පුළුවන් කාරණයක් තියෙනවා. ඇත්තටම මේ විෂය පථය එතැනට අයිතිද නැද්ද කැයලා පැහැදිලි නීතියක් නැහැ. එහෙම කියලා මහ බැංකුවට තමන්ගේ වගකීම් පැහැර හරින්න බැහැ. මොකද ප්‍රතිපත්ති තීන්දු තියෙන්න ඒ අය අතේ. ඒක දැන් ස්වාධීන ආයතනයක් කරලා තියෙන්නෙ. රටේ මූල්‍ය ප්‍රතිපත්තියේ "ප්‍රතිපත්ති තීරණ" එක ඒ අය ගන්න ඕන. ඒ වුණත් රට පුරා තියෙන මේ ආයතන නිරීක්ෂණය කරලා, පරීක්ෂා කරලා, පාලනය කරන්න ඒ අයට බැහැ. ඒ හින්දම මේකට වෙනම ආයතනයක් හදන්න ඕන. ඒ අයට බලය දෙන්න ඕන.

- **ක්ෂුද්‍ර මූල්‍ය නියාමනය කරන්න පනත් කෙටුම්පතක් හදලා ඒකට කැබිනට් අනුමැතිය ලැබිලා තියෙන පසුබිමක එම පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා සම්මත කර ගැනීම ප්‍රමාද ඇයි?**

මුදල් අමාත්‍යාංශය මගින් පනත් කෙටුම්පතක් හදාගෙන යන බවට අපට දැනුම් දීලා තියෙනවා. ඒක මුදල් අමාත්‍යාංශයට අයිති විෂයක්. හැබැයි දැනට තියෙන තොරතුරු අනුව ඒ වගේ පනතකින් මේ කාරණය හරි ලෙස පාලනය කරන්න හැකියි කියන එක ගැන අපට සැකයක් තියෙනවා. ඒකට හේතුව ක්ෂුද්‍ර මූල්‍ය ගණුදෙනු සංඛ්‍යාව පහුගිය වසර දහයක වගේ කාලය තුළ ඉතාම සීඝ්‍ර ලෙස ඉහළ ගිහින් තියෙනවා. බැංකු වලින් බලාපොරොත්තු වන දේ ඉෂ්ට කළා නම් එහෙම වෙන්නෙ නැහැ. ඒ නිසා දිගු කාලීන වශයෙන් බැංකු පද්ධතිය රිසි ලෙස සකස් කරන්න ඕන. විශේෂයෙන්ම තමන්ගේ ගණුදෙනුකරුවන් සූරාකෑම සඳහා අවශාවිතා වන නීතියක් තමයි ප්‍රසිද්ධයේ වෙන ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රමය.

අපි තේරුම් ගන්න ඕන මේ ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රමයට මිනිස්සු හැරුණේ ඇයි? ලෝකයේ වෙනත් රටවල එහෙම වෙලා නැහැ. මේකට හේතුව රටේ බැංකු පද්ධතිය රටේ සාමාන්‍ය ජනතාව අමතක කළා. බැංකු හිතුවේ ඒ අයගේ ලාභය විතරයි. රාජ්‍ය බැංකුත් ඒකම කරගෙන ගියා. කොටින්ම මහ බැංකුව පහුගිය කාලේ වගකීම් පැහැර හැරියා.

> *ගම්වල ඉන්න දුප්පත් මිනිස්සුන්ගේ දහ පහළොස් දහට මේ මිනිස්සු ඕවා ඔප්පු කරන්න උසාවි යයිද? එහෙම යන්න ක්‍රමයක් නැහැ. ඔවුන්ට යන්නත් බෑ. ඒ නිසා මේකට ප්‍රායෝගික විකල්පයක් හොයන්න ඕන..*

- **මෙහිදී දක්නට ලැබෙන ප්‍රධාන ගැටලුවක් මේ ණය ගිවිසුම් ෆෝම් ඉංග්‍රීසියෙන් පමණක් තිබීම. ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාගෙන ඇති වැඩි කාන්තාවන් ඉංග්‍රීසි තබා සිංහලවත් බැරි අය. එතකොට මේ බරපතළ අසාධාරණයක් නෙමෙයිද? ඒවට එරෙහිව ක්‍රියාත්මක වෙන්න බැරිද?**

පුළුවන්. අපේ නීතියේ තියෙනවා. යමක් තේරුම් කරලා දීලා ඒ පිළිබඳ වටහා ගත්තා කියලා සහතිකයක් තියෙන්න ඕන. ඒ සහතිකය කවුරු හරි වගකීව යුත කෙනෙක් ලබා දෙන්නෙ. දැන් වෙලා තියෙන්නෙ අධිකරණයත් මේවා සාම්ප්‍රදායක ක්‍රමයට අත්සන් කරලා තියෙනවා නම් ඒක වලංගුයි කියලා. හැබැයි මෙතනදී වංචාවක් වෙලා තියෙනවානම් කුඩ ලේඛනයක් තියෙනවානම් ඉදිරිපත් කරන්න පුළුවන්. ඒත් මේ ගම්වල ඉන්න දුප්පත් මිනිස්සුන්ගේ දහ පහළොස් දහට මේ මිනිස්සු ඕවා ඔප්පු කරන්න උසාවි යයිද? එහෙම යන්න ක්‍රමයක් නැහැ. ඔවුන්ට යන්නත් බෑ. ඒ නිසා මේකට ප්‍රායෝගික විකල්පයක් හොයන්න ඕන. ඒකට හොඳම දේ තමයි සුරක්ෂිත ක්‍රමයකට මිනිසුන්ට ණය දෙන ක්‍රමයක් හදාගන්න ඕන. දැනට මේ ඉන්න කලු පොලීකාරයෝ හදලා තියෙන්නෙ මේ බැංකු ක්‍රමයයි. ඒකට මහ බැංකුව වගකියන්න ඕන.

- **ජනමාධ්‍ය විදිහට අපි මහ බැංකුවෙන් මේ ගැටලු ගැන විමසුවහම ඒ අය පහසුවෙන්ම ලබා දෙන**

- **ඔබතුමා කියන ඔය විදිමත් ක්‍රමයක් සහ නියාමන කර්තව්‍යය අපේ රටේ පළාත් පාලන ව්‍යුහයට සම්බන්ධ කරන්න බැරිද?**

ඒක ටිකක් අමාරුයි. ඒක පළාත් මට්ටමෙන් ක්‍රියාත්මක කරන්න ගියහොත් සාර්ථක වෙන්නෙ නෑ. පළාත් මට්ටමට අවශ්‍ය ක්‍රමවේදය ගුණය එතැන නෑ. ඒක මූලික ආණ්ඩුවෙන් කරන්න ඕන දෙයක්. මම මෙහෙම කිව්වා කියලා අපිට මේක පැය 24 ආපස්සට හරවන්න බෑ. හරි ක්‍රමයකට දීර්ඝ ක්‍රියාවලියකට යන්න වෙනවා.

- **ක්ෂුද්‍ර මූල්‍ය නිසා හෙම්බත් වූ ජනතාවට යම් සහනයක් ඉටුවේ යැයි කියා හෝ බලාපොරොත්තුවක් රදවා ගන්න පුළුවන් ද?**

අධිකරණ අමාත්‍යවරයා විදිහට අනෙක් ඕනෑම අමාත්‍යංශයක්ම රාජ්‍ය ප්‍රතිපත්ති දුන්නට වැඩක් නෑ. ඒ නිසාම අපි නීති හදලා තියෙනවා යුක්තීන් සිඳ ලන්න. මේකත් සාමාන්‍ය ක්‍රමයෙන් පිට පැනලා හරි කරන්න ඕන. මුදල් අමාත්‍යාංශයත් අධිකරණ අමාත්‍යංශයත් එකතු වෙලා මේක කරන්න ඕන. මුදල් අමාත්‍යාංශය බැංකු ක්‍රම දන්නවා. හැබැයි නීතිය පිළිබඳ දන්න ප්‍රමාණය අඩුයි. අපිත් නීතිය පැත්ත දන්නවා. බැංකු ගැන අඩුයි. ඒ නිසා අපි දෙගොල්ලොම එකතු වෙලා මේක කරන්න ඕන. මම පරණ බැංකු කරුවෙක්නිසා මට ඒ ගැනත් අවබෝධයක් තියෙනවා. ඒ කොහොම වුණත් දැනට මේ ප්‍රශ්න වලට මුහුණ දීලා ඉන්න අයගේ 100% ක් ගැටලු විසඳලා දෙන්න බැහැ. මේ රටේ එහෙම වෙන්නත් බෑ. නමුත් අනාගතයේ දී මේ ප්‍රශ්න විසඳන්න පුළුවන් ද බලනවා.

(සැ.යු.: ක්ෂුද්‍ර මූල්‍ය ගැටලුව අදාළ ප්‍රශ්න කතා කිරීමට විෂය භාර ඇමති ෂෙහාන් සේමසිංහ ඇමතිවරයා සම්බන්ධ කර ගැනීමට බොහෝ වාර වල උත්සාහ කළත් එය ව්‍යර්ථ විය. අහවල් වේලාවට අහවල් දිනයට ගන්න යනුවෙන් නිතර ඇමති වරයා පැවසුවද ඒ වෙලාවන්හිදී අවස්ථාව නොලැබුණු බව මතක් කරමු.)

# ක්ෂුද්‍ර මූල්‍යකරණයේ ලාංකික ගමන් මග

ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍යකරණයට විසිවන සියවසේ මුල් භාගය දක්වා දිවෙන දිගු ඉතිහාසයක් උරුමය. විධිමත් ක්ෂුද්‍ර මූල්‍ය ආයතනය වූයේ 1906දී පිහිටුවන ලද සකසුරුවම් සහ ණය සමුපකාර සමිති (TCCS) යය. මෙම සමිති ග්‍රාමීය ප්‍රජාවන්ට ණය සහ ඉතුරුම් සේවා සපයන ලදි.

1970 දශකයේදී TCCS අද වන විට ශ්‍රී ලංකාවේ විශාලතම ක්ෂුද්‍ර මූල්‍ය ආයතනය වන සණස ව්‍යාපාරය බවට ප්‍රතිසංවිධානය කරන ලදි. මේ වනවිට සණස සාමාජිකයන් මිලියන දෙකකට අධික සංඛ්‍යාවක් සිටින අතර ණය, ඉතුරුම්, රක්ෂණ සහ පුහුණුව ඇතුළත් පුළුල් පරාසයක මූල්‍ය සේවා සපයන ආයතනයක් බවට සණස පත්වී ඇත.

1980 ගණන්වලදී ශ්‍රී ලංකා රජය ජනසවිය වැඩසටහන හරහාද ක්ෂුද්‍ර මූල්‍යකරණය ප්‍රවර්ධනය කිරීමට පටන් ගත්තේය. මෙම වැඩසටහන මගින් දිළිඳු කුටුම්භයන්ට ඔවුන්ගේ ව්‍යාපාර ආරම්භ කිරීම හෝ ව්‍යාප්ත කිරීමට උපකාර කිරීම සඳහා ණය සහ වෙනත් ආධාර ලබා දෙන ලදි.

1990 දශකයේ සිට ශ්‍රී ලංකාව තුළ ක්ෂුද්‍ර මූල්‍යකරණයේ ශීඝ්‍ර වර්ධනයක් ඇතිවිය. රාජ්‍ය නොවන සංවිධාන (NGO) සහ වාණිජ බැංකු ගණනාවක් ක්ෂුද්‍ර මූල්‍ය වෙළෙඳපොළට ප්‍රවිෂ්ඨ වී ඇතැයි ඒ මගින් විශාල පිරිසකට පුළුල් පරාසයක සේවාවන් සපයති. ඒ නිසාම මේ වනවිටත් ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය හොඳින් නියාමනය වී ප්‍රබෝධමත් වී ඇත. මිලියන පහකට වැඩි පිරිසකට සේවා සපයන ක්ෂුද්‍ර මූල්‍ය ආයතන 10,000කට අධික සංඛ්‍යාවක් ඇත.


ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව අවම කිරීම සහ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමෙහිලා ක්ෂුද්‍ර මූල්‍යකරණය සැලකිය යුතු කාර්යභාරයක් ඉටුකර ඇති බව පිළිගත යුතුය.

ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍ය ඉතිහාසයේ ප්‍රධාන සන්ධිස්ථාන කිහිපයක් මෙසේය.

- 1906දී පළමු සකසුරුවම් සහ ණය සමුපකාර සමිතිය (TCCS) පිහිටුවන ලදි.
- 1970 (TCCS) සණස ව්‍යාපාරයට ප්‍රතිසංවිධානය කෙරේ.
- 1980 දශකය - ශ්‍රී ලංකා රජය ජනසවිය වැඩසටහන දියත් කරයි.
- 1990 දශකය - රාජ්‍ය නොවන සංවිධාන සහ වාණිජ බැංකු ගණනාවක් ක්ෂුද්‍ර මූල්‍ය වෙළෙඳපොළට ඇතුළු විය.
- 2016 ක්ෂුද්‍ර මූල්‍ය අංශය නියාමනය කරමින් ක්ෂුද්‍ර මූල්‍ය පනත පනවනු ලැබේ.

ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්ෂේත්‍රය අභියෝග රැසකට මුහුණ දී සිටී. ඉහළ පොලී අනුපාතය දුප්පත්ම ජනතාවට මූල්‍ය සේවා සඳහා ප්‍රවේශය නොමැතිකම අඩු මූල්‍ය සාක්ෂරතාව, ස්වාභාවික විපත් මෙම අභියෝග මධ්‍යයේ වුවද ක්ෂුද්‍ර මූල්‍යකරණය ශ්‍රී ලංකාවේ සාර්ථක කතාවකි. එය දිළිඳුකම අඩු කිරීමට ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට සහ කාන්තාවන් සවිබල ගැන්වීමට උපකාරී වී ඇත. ඒ නිසාම නිසි නියාමනයක් සහිතව ඉදිරියට තල්ලු කළ හැකි නම් ඉදිරි වසරවලදී ක්ෂුද්‍ර මූල්‍ය අංශය අඛණ්ඩව වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කළ හැකිය. ■

**- පුරවැසියා**



යූනුස් ජොබ්රා ගම්මානයේ කාන්තාවන් අමතමින් (ඡායාරූප yale.edu)

# දුප්පතාගේ බැංකුකරු

ක්ෂුද්‍ර මූල්‍ය කතාවේ ඔහු ප්‍රධාන චරිතයය. ඔහු අත හැර ක්ෂුද්‍ර මූල්‍ය ගැන කතාබහක් පැවතිය නොහැකිය. ඔහු නමින් මොහොමඩ් යූනුස්ය.

සංවර්ධනයවෙමින් පවතින රටවල ව්‍යවසායකයින්ට කුඩා ණය ලබාදෙ ක්ෂුද්‍ර ණය සංකල්පයේ පුරෝගාමියා, පියා ලෙස සැලකෙනුයේ ඔහුය. බංගලී ජාතිකයෙක් වන ඔහු ආර්ථික විද්‍යාඥයෙකි. සමාජ ව්‍යවසායකයෙකි.

1976දී ග්‍රාමීන් බැංකුව ආරම්භ කළ ඔහු එය ලෝකයේ විශාලතම ක්ෂුද්‍ර මූල්‍ය ආයතනය බවට පත් කළේය. යූනුස් 2006දී ඒ සඳහා නොබෙල් සාම ත්‍යාගය දිනාගන්නටද සමත් විය.


යූනුස් 1940දී බංග්ලාදේශයේ චීනහොං හී උපත ලැබීය. ඩකා විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව හැදෑරූ ඔහු පසුව එහිම ආචාර්ය උපාධියද ලැබීය. එක්සත් ජනපදයේ වැන්ඩර්බිල්ට් විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධියක් ලද ඔහු නැවත බංග්ලාදේශයට පැමිණ තමා උගත් චීන හොං විශ්වවිද්‍යාලයේම ආර්ථික විද්‍යාව ඉගැන්වීය.

1976දී යූනුස් ජොබ්රා ගම්මානයේ දුප්පත් කාන්තාවන්ට මුදල් ණයට දීමට පටන් ගත්තේය. මෙම කාන්තාවන්ට බැංකුවලින් ණය ගැනීමට නොහැකි බවත්, ඒ සඳහා වටිනා ඇපයක් නොමැති බවත් යූනුස් වටහා ගත් කරුණය. මේ නිසාම යූනුස්ගේ ණය පදනම වූයේ විශ්වාසයේ මූලධර්මයයි. මෙය විධිමත් කිරීමට ස්වයං උපකාරක කණ්ඩායම් පිහිටුවීමට ඔහු ණයගැතියන්ගෙන් ඉල්ලා සිටියේය.

*ග්‍රාමීන් බැංකුව බංගලාදේශයේ දුප්පත් ජනතාවට ශුද්ධ ණය ලබාදීම ආරම්භ කරන ලදි. එහි ආරම්භය 1983දීය. එතැන් සිට බැංකුව මිලියන 90කට අධික ණයගැතියන් සඳහා ඩොලර් බිලියන 100කට වඩා ණය ලබාදී ඇත.*

එහි ව්‍යාප්තියක් ලෙස ග්‍රාමීන් බැංකුව බංගලාදේශයේ දුප්පත් ජනතාවට ශුද්ධ ණය ලබාදීම ආරම්භ කරන ලදි. එහි ආරම්භය 1983දීය. එතැන් සිට බැංකුව මිලියන 90කට අධික ණයගැතියන් සඳහා ඩොලර් බිලියන 100කට වඩා ණය ලබාදී ඇත. ඒ නිසාම ඔහු මිලියන සංඛ්‍යාවක් ජනතාව දරිද්‍රතාවයෙන් මුදාගැනීමට සමත් විය.

ග්‍රාමීන් බැංකුවට අමතරව යූනුස් ක්ෂුද්‍ර මූල්‍ය සහ සමාජ සංවර්ධනය ප්‍රවර්ධනය කරන තවත් සංවිධාන කීපයක් ආරම්භ කළේය. ඔහු 'දුප්පතුන්ට බැංකුකරු' සහ 'සමාජ ව්‍යාපාර ගොඩනැගීම' යනු කෘතිවල කතුවරයාද වේ.



යූනුස් නොබෙල් සාම ත්‍යාගය සමඟ (ඡායා: John Mcconnico/AP)

යූනුස් නොබෙල් සාම ත්‍යාගයට අමතරව නිදහසේ ජනාධිපති පදක්කම සහ පද්ම ශ්‍රී ඇතුළු සම්මාන රාශියක හිමිකරුවෙකි. ඔහු සමාජ වෙනසක් සඳහා ප්‍රමුඛ උපදේශකයෙක් වූ අතර දුප්පතුන්ගේ ගුරුයෙක්, වීරයෙක්ද විය. ■

- පුරවැසියා

# ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල කාර්යය සාධනය



(ඡායා: GIZ-PRoMIS)

ක්ෂුද්‍ර මූල්‍ය සම්බන්ධයෙන් 2006දී පැවැත්වූ අධ්‍යයනය ප්‍රතිඵලයකට අනුව මෙරට දළ ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සපයන ආයතන 14,000කට වඩා වැඩි බව සොයා ගෙන තිබුණි. ඒ 5424 වූ සණස සමිති ජාලයද ඇතුළත්වය. මේ සමිතිවලින් 50%ක ප්‍රමාණයක් ක්‍රියාකාරී නොවන මට්ටමේ ඇති බව එම වාර්තාවේම සොයා ගැනීමයි. පිළිගත හැකි මට්ටමේ ඇති ක්ෂුද්‍ර මූල්‍ය සපයන්නන් සංඛ්‍යාව 14,000කට අඩු බව අද තහවුරුය. 2006-2007 වර්ෂවලදී GIZ - PRoMiS වැඩසටහන විසින් රට පුරා ආවරණය කරමින් සිදු කළ සමීක්ෂණයට අනුව අවම වශයෙන් රට තුළ ක්‍රියාකාරී මූල්‍ය සේවා සපයන ස්ථාන 10,000ක් පැවති බව සොයාගෙන තිබේ. මහ බැංකු වාර්තාවන්ට අනුව ක්ෂුද්‍ර මූල්‍ය සේවා ස්ථාන 16,500කට වැඩි බව සඳහන් වේ.

GIZ-PRoMiS ආයතනය කළ සමීක්ෂණයට අනුව ක්ෂුද්‍ර මූල්‍ය ගනුදෙනුකරුවන්ගෙන් 90% දෙනා ග්‍රාමීය ප්‍රදේශවාසීන්ය. එහෙත් වතුකර ප්‍රදේශවල ක්‍රියාත්මක වන ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අවම ක්‍රියාකාරීත්වයකින් පවතී. එය මුළු ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සංඛ්‍යාවෙන් 1%ක් තරමය. එයින් පැහැදිලි වනුයේ දුප්පත්ම ජනතාව වෙත ක්ෂුද්‍ර මූල්‍ය ණය නොයන බවය. මාසිකව රු. 3000ක ආදායමක් ලබන අයට නිකුත් කර ඇති ණය

*GIZ-PRoMIS ආයතනය කළ සමීක්ෂණයට අනුව ක්ෂුද්‍ර මූල්‍ය ගනුදෙනුකරුවන්ගෙන් 90% දෙනා ග්‍රාමීය ප්‍රදේශවාසීන්ය. එහෙත් වතුකර ප්‍රදේශවල ක්‍රියාත්මක වන ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අවම ක්‍රියාකාරීත්වයකින් පවතී. එය මුළු ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සංඛ්‍යාවෙන් 1%ක් තරමය. එයින් පැහැදිලි වනුයේ දුප්පත්ම ජනතාව වෙත ක්ෂුද්‍ර මූල්‍ය ණය නොයන බවය.*

50%ක් වන විට මාසිකව රු. 5000ක ආදායමක් උපයන අයට ලබාදී ඇති ණය ප්‍රමාණය 82%කි.

යුද වාතාවරණය අවසන්වීමෙන් පසු බැංකු සහ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන උතුරටද ව්‍යාප්තව ඇත. පළාත් අනුව ක්ෂුද්‍ර මූල්‍ය සේවා සපයන පළාත්බද ප්‍රතිශතය මෙසේය.

- බස්නාහිර පළාත 12.2%
- මධ්‍යම පළාත 10.1%
- දකුණු පළාත 24.0%
- වයඹ පළාත 10.2%
- උතුරු මැද පළාත 3.9%
- ඌව පළාත 10.8%
- සබරගමුව පළාත 11.2%
- උතුරු පළාත 5.2%
- නැගෙනහිර පළාත 12.3%

2010 වන විට ලබාදී ඇති සමස්ත ණය මුදල රු. බිලියන 60 ඉක්මවයි. මේ තුළ වැඩිම දායකත්වයක් ලැබී ඇත්තේ ග්‍රාමීය සංවර්ධන බැංකුව සහ සණස සංවර්ධන බැංකුවටය. මීට අමතරව සර්වෝදය සීඩ්ස් ආයතනය මගින් ලබා දුන් ණය ප්‍රමාණය රුපියල් බිලියන 3 ඉක්මවයි. මෙයින් පෙනී යන්නෙ නම් ක්‍රියාත්මක වන බොහොමයක් ක්ෂුද්‍ර ආයතන තම සේවාව කුඩා ප්‍රමාණයක් කරන බවය. ■

**- විරාන් බංගගමආරච්චි**

**01 පිටුවෙන්**

# ණය ගින්නේ දැවෙන...

මැලේරියාවද වැනි උවදුරු සමගිනි. එය කිසිසේත් පහසු නොවීය. ඇතැම්විට ඒ සංග්‍රාමය ජීවිතය හා මරණය අතර දෝලනය විය. එහෙත් ඒ ධෛර්යය සම්පන්න මිනිසුන් අනවරත අරගලයක නිරත වූවා විනා මැසිවිලි හෝ කෙඳිරිලි නොනැගූ බවට සාක්ෂි දරන්නේ ඉමක් කොනක් නැති කෙත් බිම්ය.

සිරිමාවෝ ආණ්ඩුව විසින් තිස් අවුරුද්දකින් නිම කරන්නට සැලසුම් කළා වූ මහවැලි ව්‍යාපාරය හය අවුරුද්දකින් හමාර කරමින් ජේ.ආර්. ජයවර්ධන ආණ්ඩුව ගොවි ජනපදයට අරුණලු කැන්දාගෙන ආ බවක් කියතත් එහි සත්‍යතාවක් නැත. මන්දයත් සේනපුර, කාගම, කටියාව ගොවි ජනපදය මහවැලි දියවරින් එකලු වූ  බවක් නොපෙනේ.

ගොවි ජනතාව ගෙයක් දොරක් හදා ගන්නේද මැදපෙරදිග රැකියා සඳහා පිටත්ව යන කාන්තා පාර්ශ්වය හේතු කොටගෙනය. ගොවි ජනපදය පිහිටුවාලු ඩී.එස්. සේනානායකයන් ජනපදවාසීන්හට නිවාස හා කෘෂි ආම්පන්න ලබා දුන්නද කාලයාගේ ඇවෑමෙන් නිවාස මෙන්ම ඉඩම් අවශ්‍යතාවද ජනපදය තුළ දැවෙන ප්‍රශ්නයක් බවට පත් විය.

> **පවුල තුළ බිරිඳක හා මවකගේ අසීමිත යුතුකම් හා වගකීම් සම්භාරයෙන් බැහැර වන කළ පීඩාවට පත්වන දරුවන් සමාජ ගැටලුවක් බවට පත්වෙයි.**

වගා කටයුතු වෙතින් අලුත් පරපුර ඈත්වීම හා අස්වනු සඳහා නිසි මිලක් නොමැති වීම තුළ ජනපදවාසීන් මුහුණ පෑ අර්බුදය අතිවිශාලය. කාන්තාවන් මැදපෙරදිග රැකියා සඳහා පිටත්ව යන අතර තරුණ පිරිස හමුදා සේවයට එක්වීමේ ප්‍රවණතාව වඩ වඩාත් තදින් කැපී පෙනිණ. තරුණියන් ඇඟලුම් කම්හල්වල සේවය කරමින් තාරුණ්‍යයේ සිහින සැබෑකර ගැනීමට ප්‍රයත්න දරන ලදි.



උද්ඝෝෂණයක නිරත වන පීඩාවට පත් වූ කාන්තාවන්. (ඡායාරූප www.dailymirror.lk)

අඩාල වන කෘෂිකර්මාන්තය තවදුරටත් ජනපදිකයා පීඩාවට පත් කරන බැවින් ඇතැම් ගොවියන් වගා කටයුතු අතහැර කොළඹට ඇදී යන තත්ත්වයක් පැන නැගිණ.

මෙවන් පසුබිමක නිවසේ හුදෙකලා වන කාන්තාවන් ඉලක්ක කරගත් ණය ලබාදෙන ආයතන මාංශයම ගොදුරු කරගන්නා ගිජුලිහිණින් පරිද්දෙන් ජනපදය කරා පියඹා එන්නට පටන් ගති. එය දරිද්‍රතාවට කිසිදු අයුරකින් විසඳුමක් නොවිණ.

මෙකී ක්ෂුද්‍ර මූල්‍ය ආයතන විසින් අය කරන ලද්දේ අධික පොලියකි.

ණය ලබා ගන්නට සැපිරිය යුතු කොන්දේසි ලිහිල් වූ අතර ඇතැම්විට එකී නීති රීති ආදියෙන් රිංගා යන්නට උපදෙස් පවා ලබා දෙන්නට එකී ආයතනයන්හි සේවය කරන පිරිස පසුබට නොවූහ. ආයෝජනයක් සිදු නොකරන බවද නිෂ්පාදනයක් සිදු නොවන බවද දැනදැනම ණය ලබාදෙන්නට ඉදිරිපත්වීමෙන් එකී ආයතන සිය පරිත්‍යාගශීලී බව හා කාරුණික බව විදහා පෑවා නොවේ.

කෙසේ හෝ වාරික මුදල් ලබාගන්නට පමණක් ඔවුන් වගබලා ගන්නා අතර එහිදී පැන නගින අනේක ගැටලු ජනපදය තුළ තවත් අර්බුද හා අවුල් වියවුල් නිර්මාණය කරන ලදි.

ඉඩම් ගැටලු ජල හිඟය හා අස්වනු සඳහා මිලක් මෙන්ම වගාවන් වෙනුවෙන් දැරිය යුතු පිරිවැය ඉහළ යන ගැටලුකාරී පසුබිමක් තුළ පවුල් අවුල් පවා හටගන්නා තරමට මේ ක්ෂුද්‍ර මූල්‍ය ආයතනයන්හි ක්‍රියාපිළිවෙත නිර්දය විය.

සාහසික හා අන්තනෝමතික විය. වාරිකය ගෙවිය නොහැකි නම් ණයලාභියාගේ නිවසේ ගෘහභාණ්ඩ රැගෙන යාමට පමණක් නොව ලිංගික අල්ලස් පවා ලබා ගැනීමේ අවස්ථාවන්ද වාර්තා වී තිබේ.

සතිපතා හා මාස්පතා පැමිණෙන එකී ආයතනවල නියෝජිතයන් සමග සබඳතා ගොඩ නැගුණු අවස්ථාද රහසින් පලා යන්නට තරම් දුර දිග ගිය අවස්ථාද සුලබය.

පවුල තුළ බිරිඳක හා මවකගේ අසීමිත යුතුකම් හා වගකීම් සම්භාරයෙන් බැහැර වන කළ පීඩාවට පත්වන දරුවන් සමාජ ගැටලුවක් බවට පත්වෙයි. මානසික අවපීඩන තත්වයන්ට ගොදුරුවීම සහ අධ්‍යාපනයේ දුර්වලතා ඇතැම්විට මව නොමැති නිවස තුළ පියා, සොහොයුරා හෝ මුත්තනුවන් හෝ අසල්වැසියෙකු වෙතින් අපයෝජනයට ලක්වීමද වැළැක්විය නොහැකිය.

**ක්ෂුද්‍ර මූල්‍ය ණය කපා හරින බවට විටින් විට ආණ්ඩුව නිවේදනය කළද එවැන්නක් සිදු නොවූ බවද තවමත් සතිපතා හා මාසිකව වාරික ලබාගන්නට පැමිණෙන ඇතැම් නියෝජිතයන් මුදල් නොගෙවන්නේ නම් ගෘහ භාණ්ඩ රැගෙන යන බවට තර්ජනය කරන බවද පීඩාවට පත් කාන්තාවන් විසින් ප්‍රකාශ කර සිටිති.**

ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල ක්‍රියාකාරීත්වය නිසා ජනපදය අවුලෙන් අවුලට පත්ව තිබෙන බව පැහැදිලිය. එහිදී වැඩිහිටියන් මෙන්ම දරුවන්ද පීඩාවට පත් වෙති.

මේ වනවිට මේ ඇතැම් ආයතන ආ ගිය අතක් නැත. මහ බැංකුවේ ලියාපදිංචි වී නොමැති ඇතැම් ආයතන සතුව හරි හමන් ලිපිනයක් පවා නැත. එහෙයින් තවමත් වාරික මුදල් ලබාගන්නට පැමිණෙන නියෝජිතයන් තවදුරටත් එකී ආයතනයන්හි සේවය කරන වගක් හෝ තහවුරු කරගත නොහැක.

කණ්ඩායමේ සියලු සාමාජිකයන් විසින් වාරික මුදල හිඟයකින් තොරව ලබා දිය යුතු බවට පනවා තිබූ දැඩි කොන්දේසි මේ වන විට ලිහිල්ව තිබෙන අතර පෙර මෙන් කණ්ඩායම් රැස්වීම්ද නොපැවැත්වේ.

ග්‍රාමීය දිළිඳු බව තවත් වැඩි කරමින් සමාජ ආර්ථික ගැටලු රැසක් උත්පාදනය කරන ලද ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සමග දේශපාලනඥයන්ගේ සම්බන්ධතාව නොරහසක් වන අතර මහ බැංකුවටද වගකීමෙන් නිදහස් විය නොහැක

ක්ෂුද්‍ර මූල්‍ය ණය කපා හරින බවට විටින් විට ආණ්ඩුව නිවේදනය කළද එවැන්නක් සිදු නොවූ බවද තවමත් සතිපතා හා මාසිකව වාරික ලබාගන්නට පැමිණෙන ඇතැම් නියෝජිතයන් මුදල් නොගෙවන්නේ නම් ගෘහ භාණ්ඩ රැගෙන යන බවට තර්ජනය කරන බවද පීඩාවට පත් කාන්තාවන් විසින් ප්‍රකාශ කර සිටිති.

ලබා ගත් ණය ගෙවා දමන්නට විනා මගහැර සිටින්නට උත්සාහ නොදරන බවද එහෙත් අධික පොලිය දරාගත නොහැකි බවද ඔවුන් වැඩිදුරටත් පවසති.

දරිද්‍රතාව නඩත්තු කරමින් බලය ලබාගැනීමට එය භාවිත කරන දේශපාලනඥයන් ණය ගෙවා ගත නොහැකිව දිවි නසා ගත් හා පවුල් ආරාවුල්වලට මුහුණ දුන් කාන්තාවන් පමණක් නොව ඒ ව්‍යසනයෙන් පීඩා විඳින පිරිමි පාර්ශ්වය හා දරුවන් වෙනුවෙන් වගකිවයුතු බව පැහැදිලිය. මන්දයත් මේ සා විනාශයක් සිදුකරන්නට දේශපාලන අධිකාරියේ සවිය හා පූර්ණ ආශිර්වාදය රහිතව කවර හෝ ආයතනයක් අපොහොසත් බව අමුතුවෙන් කිවයුතු නැති බැවිනි. ■

**- පුරවැසියා**



(ඡායාරූප www.dailymirror.lk)



උද්ඝෝෂණයක නිරත වන පීඩාවට පත් වූ කාන්තාවන්. (ඡායාරූප www.dailymirror.lk)